# දකුණු ආසියාතික
# මුහුදු පෙදෙස

දකුණු ආසියාතික මුහුදු පෙදෙසට බංග්ලාදේශය, හෙවත් බංගලිදේශය, මාලදිවයින්, ඉන්දියාව, පකිස්තානය සහ ශ්‍රී ලංකාව අයත් වේ. මේ සියලු රටවලට තිබෙන පොදු ප්‍රශ්නය නම් දූෂණය සහ වෙරළ බද කොටස් සහ එම කොටස්වල සම්පත් හායනයයි. පර්සියා බොක්කේ සිට තෙල් ප්‍රවාහණය කැරෙන ප්‍රධාන මුහුදු මාර්ගය පිහිටා තිබෙන්නේ අරාබි මුහුද හරහාය. එම මාර්ගය ශ්‍රී ලංකාවේ දකුණු කෙළවර අසලින් වැටී බෙංගාල බොක්කේ දකුණු පෙදෙස හරහා ගොස් මැලක්කා සමුද්‍රසන්ධිය ඔස්සෙන් වැටී ඈත පෙරදිග සහ ජපානය තෙක් විහිදේ. වසරකට පිරවූ තෙල් නැව් 5000 කට වැඩි ගණනක් ශ්‍රී ලංකාවේ දකුණු වෙරළ අසලින් වැටෙන මුහුදු මගේ යාත්‍රා කරයි. ශ්‍රී ලංකාවේ දකුණු කෙළවරේ පිහිටි දෙවුන්දර තුඩුව මෙම නැව්වල ඉදිරි ගමන සඳහා මාර්ගය වෙනස් කිරීමට උදව්වන ස්ථානය වේ.

තෙල් නැව් ගමනාගමනයත්, මෙකී පෙදෙස් බොහොමයක් වැඩි වැඩියෙන් තෙල් සඳහා කරන වෙරළාසන්න කැණීම් නිසාත් ඉන්දියන් සාගරයේ උතුරු කොටස දූෂණයට ලක් වේ.

තෙල්වලින් සිදුවන දූෂණයට අමතර ව ගොඩබිමෙහි පිහිටි පිරිපහදු කම්හල් සහ නැව් තොටුවලින් නික්මෙන අපද්‍රව්‍ය ආදියෙන් දූෂණය වර්ධනය වෙයි. බංගලිදේශයේ චිතගොං වරායට වසරකට නැව් 1000 ක් පමණ පැමිණේ. තෙල් නැව් 40 කට වැඩි ගණනක් ද එයි. මොංග්ලා වරාය නැව් 500 කට පමණ පිළිදැගීම් කරයි. චිතගොං වරායෙහි වසරකට අමු තෙල් ටොන් 6000 ක් පමන ඉහිරෙන බවට ඇස්තමේන්තු කර තිබේ. පිරිපහදු කම්හල්වලින් අමු තෙල් අපද්‍රව්‍ය ටොන් 50,000 ක් පමණ වසරකට වෙරළාසන්න මුහුදට අපිරිසිදු ජලය සමග ගලාබසින බව ගණන් බලා තිබේ.

ප්‍රධාන නැව් ගමන් මාර්ග දිගේ තැනින් තැන තෙල් පාරවල් දක්නට ලැබීම සාමාන්‍ය සිද්ධියකි. මේ තත්ත්වය වඩාත් කැපීපෙනෙන්නේ බෙංගාල බොක්කේ දකුණු කොටසේ සහ අරාබි මුහුදේය.
තෙල් නිසා සිදුවන දූෂණය වෙරළ දිගට පැතිරී තිබෙන තාර කුට්ටි වැනි ද්‍රව්‍යයන් ගෙන් පැහැදිලිය. වෙරළාසන්න පෙදෙසේ දියවැල් වැටී තිබෙන ආකාරය අනුව මේ කළුපාට තාර වැනි ද්‍රව්‍ය රැඳී තිබෙන ප්‍රමාණය මැනගත හැකි ය. මෝසම් සුළං නිසා මාස හයකට වරක් මතුපිට දියවැල්වල දිශාව මාරුවේ. වෙරළ දිහාවට යොමුවන දියවැල් වර්ධනය වන අවස්ථාවල එම වෙරළ දිගට මෙම තාර කුට්ටි වැනි ද්‍රව්‍ය බහුලව දැකගත හැකිය. අන්දමන් සහ නිකෝබාර් දූපත් අවට අතොල සහ ගල්පර වලට මෙම ද්‍රව්‍ය සැහෙන හානි පමුණුවා තිබේ. පකිස්තානයේ කරච්චි වරායේ උද්භිද වර්ගයා ගේ විනාශය ද ආහාරයක් ලෙස විකිණිය හැකි බෙල්ලන් ගේ පාට වෙනස් කිරීම ද සිදු කැර ඇතැයි වාර්තා වේ. ඊයම්, කැඩ්මියම් සහ රසදිය වැනි බර, සෞඛ්‍යයට හානිකර ලෝහ වර්ග මුහුදුවල සහ වෙරළාසන්න පෙදෙස්වල දක්නට ලැබේ.

දකුණු ආසියාතික මුහුදු පෙදෙසේ වෙරළාසන්න කොටස්වල සිදුවන ඔත් පස තැන්පත් වීම අධිකය. මීට හේතුව ඒ අවට ගොඩබිම් පෙදෙසේ සිදුවන පාංශුඛාධනයයි. ඉන්දියානු උප-මහාද්වීපයේ ගංගා වාර්ෂික ව ඉන්දියන් සාගරයට රැගෙන එන ඔත් පස් ප්‍රමාණය ටොන් ලක්ෂ කෝටි 1.6 කි. බංගලි දේශය හරහා ගලන ගංගා පමණක් වසරකට ඔත් පස් ටොන් ලක්ෂ කෝටි 2.5 ක් රැගෙන එයි. මෙයින් බ්‍රහ්මපුත්‍ර ගංගාව ටොන් ලක්ෂ කෝටි 1.7 ද ගංගා නම් ගඟ ටොන් ලක්ෂ කෝටි 0.8 ක ඔත් පස් ප්‍රමාණයක් රැගෙන එයි. (UNEP. එ.ජ.ප.වැ. 1987)

දකුණු ආසියාතික මුහුදු පෙදෙසෙහි වෙරළාසන්න කොටස් සහ මුහුදු පරිසරය සුරැකීම වර්ධනය පිණිස ද එහි මනා පාලනය සඳහා ද එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන, දකුණු ආසියාතික මුහුදු පෙදෙස් වැඩසටහන අරඹා තිබේ. මෙය එම සංවිධානය ඇරැඹූ එබඳු දස වන වැඩසටහනයි. මෙය පටන් ගැනුණේ දකුණු ආසියාතික සහයෝගිතා පරිසර වැඩ සටහනේ සහ පෙදෙසේ රජයන් ගේ සහයෝගය ඇතිව ය.

අනේකාකාර ආර්ථික සහ මිනිසුන් ගේ කටයුතු හේතුකොට ගෙන වෙරළබද පරිසර පද්ධතියට දිනෙන් දින සිදුවන බලපෑම් හඳුනාගෙන සංවිධානය මෙම පෙදෙසේ රටවල් ගණනාවක් සඳහා වෙරළබද පාරිසරික කළමනාකරණ සැලැස්මක් වර්ධනය කැර තිබේ. මෙයට ශ්‍රී ලංකාව, බංගලි දේසය සහ පකිස්තානය වැනි දකුණු ආසියාතික මුහුදු පෙදෙසේ රටවල් ද ඇතුලත් ය.